ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2008

ගිවිසුම් නීතිය හා නියෝජ්‍යත්වය නීතිය – LWU 2311

කාලය – පැය තුනයි

---

දිනය : 2008.03.25 වේලාව: පෙ. ව. 09.30 – ප. ව. 12.30

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

## 1 වන කොටස නියෝජ්‍යත්ව නීතිය

මෙම කොටසින් එක් ප්‍රශ්නයක් සඳහා පමණක් පිළිතුරු සපයන්න.

(1) (අ) විසදී ඇති නඩු තීරණ අනුසාරයෙන් නියෝජ්‍යත්ව නීතියෙහි "අවශ්‍ය අධිකාරිය" නමැති මූලධර්මය පැහැදිලි කරන්න.

(ආ) නියෝජ්‍යත්ව නීතිය කෙරෙහි බලපාන විට "ප්‍රතිබන්ධන මූලධර්මයෙහි" (Doctrine of Estoppel) අර්ථය කෙටියෙන් සාකච්ඡා කරන්න.

(2) (අ) "පවරන ලද බලය යළි පැවරිය නොහැක" (Delegatus non potest delegare) යන ආප්තෝපදේශය නියෝජ්‍යත්ව නීතිය කෙරෙහි බලපාන අන්දම සාකච්ඡා කරන්න.

(ආ) විකුණූ භාණ්ඩ සම්බන්ධව 10% ක කොමිස් මුදලක් ගෙවීමේ පදනම මත සීමාසහිත හයිටෙක් ජෙන්ට්ස් නමැති ආයතනය තම තීන්ත විකිණීම සඳහා ගුණදාසව පත් කරයි. ගුණදාස හයිටෙක් ජෙන්ට්ස් ආයතනයේ අනුදැනුම නොමැතිව එම තීන්ත ස්කයිලාක් ඉන්ඩස්ට්‍රීස් නමැති ආයතනයට විකුණයි. ගුණදාස හයිටෙක් ජෙන්ට්ස් ආයතනයේ නියෝජිතයකු බවට ස්කයිලාක් ඉන්ඩස්ට්‍රීස් නමැති ආයතනය නොදනී. ස්කයිලාක් ඉන්ඩස්ට්‍රීස් ආයතනයට ණයක් ගෙවීමට බැඳී සිටි ගුණදාස එම මුදල වෙනුවෙන් තමා විසින් ස්කයිලාක් ඉන්ඩස්ට්‍රීස් ආයතනයට විකුණූ තීන්ත භාණ්ඩ සඳහා අයවිය යුතු මුදල හිලව් කිරීමට එකඟවේ. ස්කයිලාක් ඉන්ඩස්ට්‍රීස් ආයතනය තීන්ත වෙනුවෙන් ගෙවිය යුතු මුදල නොගෙවයි.

හයිටෙක් ජෙන්ට්ස් ආයතනයට උපදෙස් දෙන්න.

(3) (අ) "ප්‍රධානියාගේ ඉතාමත් වැදගත් යුතුකම වන්නේ ඉටු කලාවූ සේවාවන් සඳහා නියෝජිතයාට පාරිශ්‍රමිකයක් ගෙවීමයි".

සාකච්ඡා කරන්න.

(ආ) තම දේපල උකසට තබාගෙන ණය මුදලක් දීමට කැමති පුද්ගලයෙකු සෙවීමේ කාර්යය සිරිසේන විසින් ඔහුගේ නියෝජිතයා වූ පියසේනට පවරන ලදි. බලවත් පරිශ්‍රමයක් දැරීමෙන් අනතුරුව අවශ්‍ය මුදල ණයට සැපයීමට කැමති ජයතිස්ස නමැති පුද්ගලයෙකු සොයා ගැනීමට පියසේනට හැකි විය. උකසට තැබීමට නියමිත දේපල සම්බන්ධයෙන් සිරිසේනට නියම අයිතියක් නොමැති බව පසුව අනාවරණයවූ හෙයින් එම ගනුදෙනුව සිදු නොවිය .

පියසේනට උපදෙස් දෙන්න.

## 11 වන කොටස ගිවිසුම් නීතිය

ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

(4) සතර දිනක් ඇතුළතදී කොළඹ සිට මහනුවරට පා ගමනින් යන ඕනෑම අයෙකුට රුපියල් 25000 ක් තමා විසින් ගෙවන බවට ක්‍රීඩා ලෝලියකු වූ රන්ජන් පුවත් පත් දැන්වීමක් පළ කළේය. තරඟකරුවෝ ජනවාරි 01 වන දින කැළණි පාලමේ සිට ගමන ආරම්භ කළ යුතු විය. තරඟකරුවෝ විශාල සංඛ්‍යාවක් නියමිත වේලාව තුළදී ගමන ආරම්භ කළ නමුත් නියමිත වේලාව තුළදී තරඟය නිම කළේ රොහාන්, මොහාන් සහ සොහාන් පමණි. තරඟයේ අවසාන දිනයේදී ජයග්‍රහණය කරන සියළු දෙනාටම තෑගි මුදල් දීම සඳහා මුදල් නොමැති බව පවසමින් රන්ජන් තම අර්පණය ඉල්ලා අස්කර ගනිමින් පුවත් පත් දැන්වීමක් දෙවන වරට පළ කළේය.

(අ) රොහාන් මෙම ඉල්ලා අස්කර ගැනීම පිළිබඳව දැනගත්තේ ගරඟය අවසන් කිරීමෙන් පසුවය.

(ආ) මොහාන් පාරේ ගමන් කරමින් සිටියදී, අර්පණය ඉල්ලා අස්කර ගෙන ඇති බව පුවත් පත් කලාවේදියකු ඔහුට පැවසූ නමුත්, එම තොරතුර විශ්වාස කල නොහැකි එකක් බව සලකා, එම තොරතුර නොසලකා හැරීමට තීරණය කොට තරඟය නිම කළේය.

(ඇ) සොහාන් මෙම තරඟය පිළිබඳව මුල් අර්පණය ගැන කිසිවක් නොදැන තරඟයට සහභාගිවූයේ තම කායික ශක්තිය මැන බැලීමටය.

රොහාන් මොහාන් සහ සොහාන්ට ත්‍යාග ඉල්ලා සිටිය හැකිද? සාකච්ඡා කරන්න.

(5) ව්‍යාපාරික කොටස් තැරැව්කාරයකු වන ඩේවිඩ් වෙත පැමිණි හෙන්රි සීමාසහිත සන්හිල් එන්ටර්ප්‍රයිසස් ආයතනයේ කොටස්වල ආයෝජනය කිරීමේ සුදුසුභාවය සම්බන්ධව ඩේවිඩ්ගෙන් විමසයි. එවිට ඩේවිඩ් මෙසේ පැවසීය. “ඔබ එහි කොටස් ආයෝජනය කළ යුතුයි. එම සමාගම ඉතා ශක්තිමත් එකකි. එහි ක්‍රියාකාරීත්වයෙන් නිරතුරුවම සාර්ථක ප්‍රතිඵල ඉටුවේ. ඉතා ප්‍රසිද්ධ පිළිගත් සමාගම් අධ්‍යක්ෂකවරයෙකු වන නෝර්ටන් ද අල්විස් එම සමාගමේ අධ්‍යක්ෂකවරයෙකි. මට එම සමාගමේ කොටස් 10,000කට හිමිකම් ඇත එම කොටස් ඔබට විකිණීමට මම කැමැත්තෙමි” හෙන්රි විසින් ඩේවිඩ්ගේ කොටස් රුපියල් 400,000ක මුදලකට මිලදී ගත්තේය. මාස දෙකකට පසුව එම සමාගම විසුරුවා හැරීමට භාජනය විය. එහි කොටස් දැන් කිසිම වටිනාකමක් නොමැති තත්වයකට පත්විය.

පහත සඳහන් කරුණු පසුව අනාවරණය විය.

(අ) ඩේවිඩ්ගේ ප්‍රකාශයෙන් සති දෙකකට පසුව අධ්‍යක්ෂක මණ්ඩලයෙන් නෝර්ටන් ද අල්විස් ඉල්ලා අස්විය.

(ආ) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් බේවිඩ් කල ප්‍රකාශය පදනම් වුයේ ව්‍යපාරික සගරාවක පලවූ ලිපියක් හේතු කොටගෙනය එම ලිපියේ අඩංගුදෑ සන්හිල් එන්ටර්ප්‍රයිසස් නමැති ආයතනය සම්බන්ධයෙන් වුවද, මුද්‍රණ දෝෂයක් නිසා එම නම 'සීමාසහිත සන්හිල් එන්ටර්ප්‍රයිසස්' යනුවෙන් සදහන් වුනි.

හෙන්රිට උපදෙස් දෙන්න.

(6) (අ) "බැහැර කිරීමේ වගන්ති වල විෂය පථය සීමා කිරීමට අධිකරණය විසින් ඉතා සුපරික්ෂාකාරී සියුම් හා තීක්ෂණ පිළිවෙතක් අනුගමනය කරනු ඇත." අදහස් දක්වන්න.

(ආ) රුපියල් පන්දහසකට බීජ අර්තාපල් ප්‍රමාණයක් රන්ජන්ට සැපයීමට ඇග්‍රිකෝලා සමාගම එකඟ විය. එම සමාගම හා රන්ජන් අතර ඇතිකර ගත් ගිවිසුමේ වගන්තියක් ප්‍රකාර, මෙම බීජ අර්තාපල් තොගය දෝෂ සහගත බවට ඔප්පු වුවහොත්, මෙම බීජ අර්තාපල් තොගය වෙනුවට වෙනත් තොගයක් දීමට හෝ ගැනුම් මිලට ආපසු ගෙවීමටත් කටයුතු සලසා තිබුණි. එම වගන්තියේ තවදුරටත් සදහන් වූ අන්දමට වෙනත් වගකීම් සියළු දෙයක්ම බැහැර කොට තිබිණි. ඇග්‍රිකෝලා සමාගමේ සේවකයින්ගේ නොසැලකිල්ල හේතුකොටගෙන සැපයූ බීජ අර්තාපල් තොගය, ගිවිසුමට එළඹුනු වර්ගයේ බීජ අර්තාපල් තොගයක් නොවීම නිසා එය පාවිච්චි කිරීමට නොහැකි විය. තමා වගා කිරීමට අදහස් කල අක්කර 03ක බිම් ප්‍රමාණයක වාර්ෂික නිෂ්පාදනය රන්ජන්ට අහිමිවූ අතර ඇග්‍රිකෝලා සමාගමෙන් ඔහු වන්දි ඉල්ලා සිටී.

සාකච්ඡා කරන්න.

(7) (අ) ගිවිසුම් නීතියෙහි "ව්‍යර්ථීකරණය නමැති න්‍යයායෙහි" (Doctrine of frustration) විෂය සීමාව හා අදාළ වීමේහි මූලික සිද්ධාන්ත කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ආ) රුපියල් 15,000/- ක කුලියක් මත සමන් විසින් තමන්ට අයත් සංචාරක බංගලාවක් සුරේශ් සහ ඔහුගේ පවුලේ සාමාජිකයන්ට සුමානයකට පාවිච්චි කිරීමට ඉඩදීමට එකඟවිය. මේ සඳහා සුරේශ් විසින් රුපියල් 5000/- ක තැන්පත් මුදලක් ගෙවන ලදි. ඉතිරි මුදල ගෙවිය යුතු වූයේ නිවාඩුව ආරම්භ වීමට නියමිත දිනට පෙර දිනය. නිවාඩුව ආරම්භ වීමට දින දෙකකට ප්‍රථම සුරේශ්ගේ දරුවන්ට කම්මුල්ගාය වැළදින. මේ බව දන්වා වෛද්‍ය සහතිකයක් සමන්ට යැවූ සුරේශ් නිවාඩුව අවලංගු කිරීමට සිදුවන බව දැන්වීය. සමන් මේ පිළිබඳව තම කණගාටුව ප්‍රකාශ කළද, ගිවිස ගෙන ඇති මුදල ඉල්ලා සිටියේය.

සුරේශ්ට උපදෙස් දෙන්න.

(8) "යම් කිසි ගිවිසුමක් කඩකිරීම හේතුකොට ගෙන අවසන්ව ඇතැයි සැලකීමට හෝ නොසැලකීමට නිර්දෝෂී පාර්ශවකරුවකු විසින් තීරණය කළද නොකලද, ගිවිසුමක් කඩකිරීම හේතුකොට ගෙන පැන නගින අලාභ අය කර ගැනීමට නඩුකරයක් ඉදිරිපත් කිරීමේ අයිතියක් නිර්දෝෂී පාර්ශවකරුට ඇත. ඔහු විසින් විදින ලද අලාභ වලට කොපමණ දුරට වන්දි ලැබිය යුතුදැයි රදා පවතින්නේ අලාභයේ දුරස්ථභාවය (remoteness of damage) පිළිබඳව ඇති රීති මතය".

විසදී ඇති නඩු තීරණ අනුසාරයෙන් ඉහත කියමන සාකච්ඡා කරන්න.

(9) (අ) "ත්‍යාගකරුගේ ජීවිත කාලය තුල දෙන ලද ත්‍යාගයක් ( ජීවත්ව සිටින්නවුන් අතර ත්‍යාගය, *donatio intervivos*) සාමාන්‍ය රීතියක් වශයෙන් අවලංගු කිරීමට නොහැකි වුවද, යම් විශේෂ අවස්ථාවන්හිදී, අධිකරණ ආඥාවක ආධාරයෙන් එවැනි ත්‍යාගයක් අවලංගුකිරීමට ත්‍යාගකරුට හැකිය."

සාකච්ඡා කරන්න.

(ආ) "මරණාසන්න ත්‍යාගය (*donatio mortis cause)* ගිවිසුමක ස්වභාවයක් හා තෙස්තමේන්තු දායාදයක ස්වභාවයක් උසුලන විශේෂ වර්ගයේ ත්‍යාගයකි".

සාකච්ඡා කරන්න.

(10) පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් සම්බන්ධව සටහන් ලියන්න.

(අ) උත්තර්ජනය (Duress)

(ආ) අයුතු බලපෑම (Undue influence)

(ඇ) බාලවයස්කරුවන්ගේ සහය නොලත් ගිවිසුම් (Unassisted contracts of minors)

(ඈ) නවීකරණය (Novation)

(ඉ) ප්‍රමාණ කළ අලාභ (Liquidated damages) හා දණ්ඩනය (penalty).

හිමිකම් ඇවිරිණි
************